නිර්මාතෘවරයා කවුරුද යන්න පමණකි. ඒ ජයග්‍රහණයේ වැඩි ගෞරවය හිමිවිය යුත්තේ මීට පෙර රාජ්‍ය නායකයන් හා නායිකාවන් ක්‍රියාත්මක කිරීමට පසුබට වූ ක්‍රියාන්විතයක් නොයෙක් බාධාවන් මත කරට ගෙන ත්‍රිවිධ හමුදාවන් හා මුළු මහත් ජනතාව සටනට යොමු කළ සේනාධිනායක ජනාධිපතිවරයා ද නැතිනම් ත්‍රිවිධ හමුදාවෙන් එක් හමුදාවක නායකත්වය හෙබැවු දේශපාලනයට නවකයෙකු වූ හමුදාපතිවරයා ද යන්න පමණකි. ජනතාව තීන්දුව ප්‍රකාශ කළේ ඒ අනුවය.

### *අන්තිම දේශපාලන ලිපිය*

අවුරුදු කිහිපයකට පසු මා 2009 පෙබරවාරි මාසයේ ලංකාවට පැමිණියේ ඇයි?
2002 ඊනියා සටන් විරාම (MOU) ගිවිසුම අත්සන් කළ දා පටන් මම එයින් සිදුවන විනාශය විස්තර කරමින් ඕස්ට්‍රේලියාවේත් ශ්‍රී ලංකාවේත් පුවත්පත් හා සඟරා කිහිපයකට ලිපි සැපයුවෙමි.

***දැන් ජනාධිපතිවරණය අවසානය. මම ස්වේච්ඡාවෙන් මගේ යුතුකම් හා වගකීම් කොටස නොපිරිහෙළා ඉටු කළෙමි. තවදුරටත් ශ්‍රී ලංකාවේ නතර වී සිටීමට ප්‍රමාණවත් සම්පත් මා සතුව නැත. එමනිසා නිදහස් දින රාත්‍රී මම පෙරළා ඕස්ට්‍රේලියාව බලා යන්නෙමි.***

පසුගිය (2009) වර්ෂය මුලදී ඕස්ට්‍රේලියාවේ ABC ටෙලිවිසනයෙන් ELDERS නමැති වැඩසටහනකදී මැල්කම් රීට් නැමැති ප්‍රසිද්ධ රෝමානු අයිරිෂ් ජාතික පියනමක් එක සිද්ධියක් ගැන කතා කළේය. සිද්ධිය මෙසේය.

'ඕස්ට්‍රේලියාවේ සංක්‍රමණය හා සරණාගත නීති මානුෂිකව ක්‍රියාත්මක වන බවක් නොපෙනේ. උතුරු ශ්‍රී ලංකාවේ තරුණයෙක් ත්‍රස්තවාදී (LTTE) ව්‍යාපාරයට සම්බන්ධ වී සිටියේය. එම ව්‍යාපාරය ලාබාල දරුවන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් බලහත්කාරයෙන් යුද පුහුණුවට බඳවා ගති. එක් තරුණ ශිෂ්‍යාවකට යුද පුහුණුව සඳහා පැමිණෙන්නැයි නියෝග කළ විට ඇය ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ අ.පො.ස. සා පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු පුහුණුවට ඒමට අවසර දෙන ලෙසය. මේ ගැන කුපිත වූ ත්‍රස්තවාදීහු ඇගේ දකුණු අතේ ඇඟිලි තුනක් කපා දැමූහ. මේ සිද්ධියෙන් උරණ වූ අපගේ තරුණයා ත්‍රස්තවාදී කඳවුරෙන් පලා විත් ඕස්ට්‍රේලියාවේ දේශපාලන රැකවරණය ඉල්ලා සිටියේය. මේ සිද්ධිය දේශපාලන රැකවරණය දීමට හේතුවක් නොවන බව කියමින් එය ප්‍රතික්ෂේප කරන ලදී. මට කරුණු කියා එම තීරණය වෙනස් කිරීමට සිදු විණි.

රීට් පියතුමාගේ මේ ප්‍රකාශය අපි ඕස්ට්‍රේලියාවේ 'පහන' සඟරාවේ ඉංගිරිසියෙන් පළ කළෙමු. එය ලංකාවේ රජයේ පුවත්පත් ආයතනයක ඉරිදා පුවත්පතකට අපි ෆැක්ස් මාර්ගයෙන් එවුවෙමු. ඒ ගැන දුරකතන මගින් කතා කළ විට අපට කියා සිටියේ එය එතරම් වැදගත් ප්‍රවෘත්තියක් නොවන බවය. මේ නිසා ලංකාවට පැමිණ ජනප්‍රිය මාධ්‍ය මගින් යුද්ධය හා රටේ ස්වෛරීභාවය සඳහා හැකි තරමින් සහාය දීමට මම තීරණය කළෙමි.
වර්ෂයකට ආසන්න කාලයක් තුළ මගේ අත්දැකීම් ජනතාව අතරට ගෙන යාමට මට වැඩිපුරම ඉඩ ලබාදුන්නේ 'සියත' දේශපාලන පිටුවයි.
මේ සඳහා මට විශාල අනුග්‍රහයක් ලැබුණේ 'සියත' කර්තෘ මා මිත්‍ර තිලකරත්න කුරුවිටබණ්ඩාරගෙනි. තවත් පුවත්පත් කිහිපයකට ද මම ලිපි රාශියක් සැපයීමි. මේ ලිපි සඳහා මම කිසිදු ගෙවීමක් ලබා නොගතිමි. එය හුදෙක් ජාතියට මගෙන් සිදුවන සේවයක් ලෙස මම සැලකීමි.

දැන් ජනාධිපතිවරණය අවසානය. මම ස්වේච්ඡාවෙන් මගේ යුතුකම් හා වගකීම් කොටස නොපිරිහෙළා ඉටු කළෙමි. තවදුරටත් ශ්‍රී ලංකාවේ නතර වී සිටීමට ප්‍රමාණවත් සම්පත් මා සතුව නැත. එමනිසා නිදහස් දින (පෙබරවාරි 4 දින) රාත්‍රී මම පෙරළා ඕස්ට්‍රේලියාව බලා යන්නෙමි.

මගේ ලිපිවලට ප්‍රශංසා කරමින් මට ලැබුණු දුරකතන ඇමතුම් ද අනන්තය. නිතර නිතර එසේ කළ ආචාර්ය ලීල් ගුණසේකර මහ බැංකුවේ හිටපු අධිපති ඒ.එස්. ජයවර්ධන, හිටපු ජ්‍යෙෂ්ඨ සිවිල් නිලධාරී අමර හේවාමද්දුම සහ මාධ්‍යවේදී බර්ටි ගලහිටියාව යන මහත්වරුන්ගේ නම් මෙහිදී සිහිපත් කරන්නේ කෘතඥතා පූර්වකවය.
සියතේ පාඨක සැමට සුබ අනාගතයක් පතන අතර කාලීන දේශපාලන ලිපියක් ලිවීම විදේශගතව සිටියදී ප්‍රායෝගික නොවන නිසා හැකි සෑම අවස්ථාවකදීම මගේ අත්දැකීම් ඔබ සමඟ ඉදිරියටත් බෙදා ගැනීමට මම අපේක්ෂා කරමි.

ප්‍රවීණ මාධ්‍යවේදී
**ඇස්.පියසේන**


Bring your Nephew/Niece/Brother or Sister to

# STUDY IN AUSTRALIA



"STUDY HOSPITALITY, TOURISM, RESORTS, EVENTS OR COOKERY"
@
William Angliss Institute | Specialist centre for foods, tourism & hospitality
Keeping people out of desk jobs for 70 years
CRICOS:01505M
"DIPLOMA, ADVANCED DIPLOMA, AND BACHELOR DEGREE COURSES ARE AVAILABLE".
This Institute is specialist centre for Hospitality, Tourism and Culinary Arts.
For Total Free Visa Processing
SHEFFIELD EDUCATIONAL CONSULTANCY
QEAC Qualified Education Agent Counsellor
Australia: P.O.Box 193, Chadstone Shopping Centre,Chadstone, VIC-3148. Tel:+61 387074812, 0425 663222
Sri Lanka: 91/4 Maharagama RD Piliyandala Tel:+94 11 2616125 0777 838403 | 1/1 Trinity Gardens Pallekelle, Kundasale, Kandy Tel:+94 812420418 0777 802065
Email : Sheffield.officers@gmail.com | Web : www. sheffieldec.com.au

# MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

**ONSHORE**
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

**OFFSHORE**
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms
Meet our qualified consultants with **years of experience** who can deliver the **results**
Senior Migration Consultants:
**Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986**
Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
For More Details or Free Online Assesment Visit Our Website
MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA
MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696
**www.multinational.com.au**
E-mail : info@multinational.com.au